# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
## කර්මාන්ත හා ව්‍යවසායකත්ව හා සංවර්ධන අමාත්‍යාංශය
## තනතුරු පුරප්පාඩු

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් අතුරින් සුදුසුකම්ලත් හා අත්දැකීම් සහිත අපේක්ෂකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. <u>මුල්‍ය නිලධාරි (JM 1-1) - තනතුරු 01</u>

**<u>සුදුසුකම් හා පළපුරුද්ද:</u>**
**<u>බාහිර අයදුම්කරුවන්</u>**

ආ). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් විශ්ව විද්‍යාලයක ගිණුම්කරණය / කළමනාකරණය / වාණිජ්‍යය පිළිබඳ උපාධියක්
හෝ

ආ) පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක ව්‍යාපාර ගිණුම්කරණය / මුල්‍ය පිළිබඳ අන්තර් මාධ්‍ය විභාගය සමත්ව තිබීම.
හෝ

ඇ) තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ කාර්මික / වෘත්තිය / කළමනාකරණ පුහුණු ආයතනයකින් ගණකාධිකරණය හෝ මුල්‍ය පිළිබඳ ලබාගත් NVQ - 7 මට්ටමේ සුදුසුකම හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**

අ) ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අදාල වන සුදුසුකම් සපුරා තිබීම.
හෝ

ආ) කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (MA 1) II ශ්‍රේණියෙහි තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයෙහි වසර 05ක සතුටුදායක සේවා කාලයක් ලබා තිබීම.

**<u>වැටුප් පරිමාණය</u>**

JM 1-1 – රු. 72,650 – 1,360 X 10 – 2,040 X 18 - 122,970/- + රජයේ අනුමත දීමනා හිමි වේ.
*(මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වනුයේ 2027.01.01 දින සිටය)*

<u>වැටුප</u> - 2025.01.01 දිනට මූලික වැටුප රු. 58,615/-කි. (ක.සේ.දෙ. චක්‍ර ලේඛ 01/2025 අනුව)

**<u>වයස</u>**
අවුරුදු 22 ට නොඅඩු සහ 45 නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස බලනොපායි.

### 02. <u>මුල්‍ය සහකාර – තනතුරු 01 (MA 5-1)</u>

**<u>සුදුසුකම් හා පළපුරුද්ද:</u>**
**<u>බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**

අ) ගණකාධිකරණය/ කළමනාකරණය/ වාණිජ්‍ය / ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය ලබා තිබීම හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (ICASL)හෝ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ (CIMA) හෝ සහතිකලත් සහ සංයුක්ත ගණකාධිකාරිවරුන්ගේ සංගමයෙහි (ACCA) අන්තර් මාධ්‍ය විභාගය සමත්ව තිබීම හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සමත් වී තිබීම.

- පළමු හෝ දෙවන පෙළ සාමාර්ථයක් සහිතව අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමිවේ.

ආ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් වැඩ කිරීමට හැකිවීම අත්‍යාවශ්‍යයි.

**<u>වැටුප් පරිමාණය</u>**

MA 5-1- රු. 58,740 – 1,190 X 10- 1,360 X 15 -1,670 X 11 – 109,410/- + රජයේ අනුමත දීමනා
*(මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වනුයේ 2027.01.01 දින සිටය)*

<u>වැටුප</u> - 2025.01.01 දිනට මූලික වැටුප රු. 49,031/-කි. (ක.සේ.දෙ. චක්‍ර ලේඛ 01/2025 අනුව)

**<u>වයස</u>**
අවුරුදු 22 ට නොඅඩු සහ 45 නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස බලනොපායි.

## 03. පොත් තබන්නා (MA 2-2) - තනතුරු 01

**සුදුසුකම් හා පළපුරුද්ද**
**බාහිර / අභ්‍යන්තර අයදුම්කරුවන්**

අ) අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා එකවර විෂයන් 06ක් සමත්ව තිබීම සහ එහි පහත විෂයන් ඇතුලත්ව සම්මාන සමාර්ථ 4ක් ලබා තිබීම;
- සිංහල / දෙමල
- ඉංග්‍රීසි භාෂාව
- ගණිතය

ආ) අ.පො.ස. (උ.පෙළ.) විභාගය විෂයන් 03ක් සහිතව සමත්ව තිබීම (සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රයට අමතරව.)

(ඇ) පොත් තබන්නාගේ ආයතනයේ සාමාජිකත්වය හෝ ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පි ආයතනයේ අවසන් විභාගය (AAT) සමත් වීම හෝ පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් පියවර 05 (NVQ 5) මට්ටමට අඩු නොවන ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

ඈ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් වැඩ කිරීමට හැකිවීම අත්‍යාවශ්‍යයි.
අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

**වැටුප් පරිමාණය**
MA 2-2 රු. 50,540 - 540 X 10 – 630 X 7 – 1,080 X 4 – 1,280 X 20 - 90,270/- + රජයේ අනුමත දීමනා *(මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වනුයේ 2027.01.01 දින සිටය)*

**වැටුප** - 2025.01.01 දිනට මූලික වැටුප රු. 43,379/-කි. (ක.සේ.දෙ. චක්‍ර ලේඛ 01/2025 අනුව)

**වයස**
අවුරුදු 18 ට නොඅඩු සහ 45 නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස බලනොපායි.

## 04. කළමනාකරණ සහකාර (MA 1-2) – තනතුරු 10

**සුදුසුකම් හා පළපුරුද්ද:**
**බාහිර අයදුම්කරුවන්**

(අ) අ.පො.ස. (සා.පෙළ.) විභාගයෙන් එකවර විෂයන් 06ක් සමත්ව විය යුතු අතර පහත විෂයන් ඇතුලත් වන පරිදි සම්මාන සමාර්ථ 4ක් ලබා තිබීම;
- සිංහල / දෙමල
- ඉංග්‍රීසි භාෂාව
- ගණිතය

(ආ) අ.පො.ස. (උ.පෙළ.) විභාගය විෂයන් 03ක් සහිතව සමත්ව තිබීම (සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රයට අමතරව.)

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ප්‍රාථමික මට්ටමේ නිපුණ (PL 3), අර්ධ නිපුණ (PL 2) සහ නිපුණ නොවන (PL 1) කාණ්ඩයේ සේවකයන් පහත සුදුසුකම් සපුරා ඇතිනම් අයදුම් කිරීමට හැකිය.

**අධ්‍යාපන සුදුසුකම්**
අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයන් 06ක් සමත්ව තිබීම හා පහත විෂයන් ඇතුලත්ව සම්මාන සමාර්ථ 4ක් ලබා තිබීම.
- සිංහල / දෙමල
- ගණිතය

**අනෙකුත් සුදුසුකම්**
ඉහත සේවා කාණ්ඩයන් හෝ එකක් යටතේ අවම තරමින් වසර 05ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම.

**<u>වැටුප් පරිමාණය</u>**

MA 1-2 රු. 46,220 - 540 X 10 – 630 X 7 – 1,080 X 12 – 1,280 X 12 – 84,350/- (+ රජයේ අනුමත දීමනා) *(මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වනුයේ 2027.01.01 දින සිටය.)*

<u>වැටුප</u> - 2025.01.01 දිනට මූලික වැටුප රු. 40,403/-කි. (ක.සේ.දෙ. චක්‍ර ලේඛ 01/2025 අනුව)

**වයස :**
අවුරුදු 18 ට නොඅඩු සහ 45 නොවැඩි විය යුතුය. (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස බලපානු නොලැබේ.

<u>අතිරේක ප්‍රතිලාභ -</u>

- සේවක අර්ථසාධක / භාරකාරත්ව අරමුදලේ හිමිකම
- වාර්ෂික ලාභ මත ගෙවනු ලබන දිරි දීමනා
- සේවකයා සහ ඔහු / ඇයගේ පවුලේ අය සඳහා වෛද්‍යාධාර ප්‍රතිපූර්ණය
- ප්‍රවාහන දීමනා
- ත්‍යාග දීමනා
- නිවාස ණය පොලී සහ වෙනත් ණය පහසුකම්

ඉහත සියලු තනතුරු සඳහා අයදුම් කරන පුරවැසියන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

ඉහත තනතුර සම්බන්ධව උනන්දුවක් දක්වන අයදුම්කරුවන් තම අයදුම්පත් ඔබ ගැන විස්තර ලබාගත හැකි ඥාති නොවන දෙදෙනෙකුගේ නම්, තනතුරු හා දුරකථන අංක අයදුම්පත්‍රයට ඇතුලත් කොට තම අධ්‍යාපන සහතික වල පිටපත් ද සමඟ එවිය යුතු වේ.

ඉහත දක්වන ලද සුදුසුකම් සහිත අපේක්ෂකයින් සිය අයදුම්පත 2025.11.07 දින හෝ එදිනට පෙර අයදුම්කරනු ලබන තනතුරේ නම ලියුම් කවරයේ වම් ඉහල කෙලවරේ සඳහන් කර සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි වෙත පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. රාජ්‍ය අංශයේ සේවය කරන අපේක්ෂකයින් සිය අයදුම්පත එවිය යුත්තේ සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහාය. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කෙරේ


**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි**
**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය**
**අංක 12. මැක්සන්ස් ටවර්, ඇල්ෆ්‍රඩ් හවුස් ගාර්ඩන්, කොළඹ 03**
**දුරකථන : 011-2329295/2325364/2390645-8 ෆැක්ස් : 011-2320758**
**වෙබ් අඩවිය : www.ngja.gov.lk**